9 උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව

ධර්මසේන හිමි (දඹදෙණි අවධිය)

දඹදෙණි රාජධානියේ දෙවන පැරකුම් රජු දවස රචනා වූ ග්‍රන්ථයක් ලෙසින් **සද්ධර්මරත්නාවලිය** හැඳින්වේ. කෘතිය අවසානයේ කර්තෘ සන්දර්ශන ගාථාවෙහි "සද්ධර්මයෙහි ස්ථිර පැවැත්ම කැමති වන ධර්මසේන නාහිමියෝ උතුම් සද්ධර්මරත්නාවලිය ලියූහ" යි දක්වේ. සද්ධර්මරත්නාවලිය රචනා කිරීමෙහි කතුවරයාගේ අරමුණ ග්‍රන්ථ ආරම්භයේ ඉතා නිරවුල් ව ප්‍රකාශ වේ.

"...යම් කෙනෙක් නුවණ මඳ වත් කුසලච්ඡන්දය ඇතිව ධර්මාභියෝගයට උපදෙස් ලදින් බණ දැන පින් කමැ හැසිර නිවන් සාදා ගනිත් නම් එසේ වූ පුරුෂයන්ට වැඩ සඳහා සද්ධර්මරත්නාවලිය නම් වූ ප්‍රබන්ධයක් කරම්හ."

පූර්විකාවේ දැක්වෙන මේ සඳහනට අනුව සද්ධර්මරත්නාවලිය රචනා කොට ඇත්තේ සාමාන්‍ය පොදු ජනතාව අරමුණු කොට ගෙන බව පැහැදිලි වේ. සද්ධර්මරත්නාවලිය ලියා ඇත්තේ බුද්ධඝෝෂ හිමියන්ගේ **ධම්මපදට්ඨකථාව** ඇසුරෙනි. ධම්මපදට්ඨකථාව යනු ධම්මපද නම් ගාථා සංග්‍රහයට ලියන ලද පාළි අටුවා ග්‍රන්ථයයි. එම අටුවා ග්‍රන්ථයෙහි එක් එක් ගාථාවට නිධාන වූ කතා වස්තූන් දක්වා ඇත. සද්ධර්මරත්නාවලිය රචනා කිරීම සඳහා ධම්මපදට්ඨකථාව පරිහරණය කළ ආකාරය ද ධර්මසේන හිමියෝ තම ග්‍රන්ථයෙහි දක්වති.

"පාලි ක්‍රමය හැර අර්ථය පමණක් ගෙන අප කළා වූ ප්‍රබන්ධයෙහි ක්‍රම විලංඝණාදි වූ අඩු වැඩි ඇතත් එය නොසලකා..."

මේ ප්‍රකාශය අනුව සද්ධර්මරත්නාවලිය ධම්මපදට්ඨකථාවේ පරිවර්තනයක් හෝ අනුවර්තනයක් නො ව, එහි ආභාසය ලබා කතුවරයාගේ ස්වාධීන හැකියාව මත රචනා කර ඇති බව පිළිගැනීම වඩා සුදුසු ය.

පාලි කතා වස්තූන් මුල් කොට ගෙන සිංහලෙන් කතා කීමේ ශෛලිය හඳුන්වන්නේ බණ කතා රීතිය ලෙසිනි. බණ කතා රීතියෙන් රචනා වූ සද්ධර්මරත්නාවලියෙහි කතුවරයාගේ ස්වාධීනත්වය ඉස්මතු වී පෙනේ. කතුවරයාගේ ස්වීයත්වය, නිර්මාණ ශක්තිය, කතා කලාව, ජීවිත පරිඥානය ආදිය විශේෂයෙන් ම මෙම කෘතියෙන් මතු වී පෙනේ. යොදා ගත් භාෂාව ද මේ කරුණු තහවුරු කරවන්නකි. පණ්ඩිත ප්‍රිය භාෂාව, ලෝක ව්‍යවහාරය මෙන් ම ගැමි ව්‍යවහාර භාෂාව සම්මිශ්‍ර කර ගත් භාෂාවක් සද්ධර්මරත්නාවලිය රචනා කිරීම සඳහා භාවිත කොට ඇත. ගැමි ජන ජීවිතය ඇසුරෙන් පමණක් නො ව, කවි සමයට ද අදාළ උපමා, පිරුළු භාවිත කිරීම ද මේ කතා රසවත් වීමට හේතුවකි.

ඇතැම් විටෙක කෙටි වැකි භාවිත කරන ධර්මසේන හිමියෝ තවත් තැනෙක දිගු වැකි භාවිත කරති. කරුණු නිරවුල් ව අවබෝධ කර ගැනීමට එය ඉමහත් ප්‍රයෝජනයකි. වර්ණනාත්මක අවස්ථාවල දී දිගු වැකි භාවිතයට යොමු වූ බවත් කතාවෙහි ජීව ගුණය ආරක්ෂා කිරීම සඳහා ඇතැම් කතාවල සංවාදාත්මක භාෂාවක් යොදා ගත් බවත් පෙනේ.

ධර්මසේන හිමියන්ගේ කතාවල දක්නට ලැබෙන්නේ මනුෂ්‍යත්වය පිළිබඳ සානුකම්පිත දෘෂ්ටියකි. චරිත නිරූපණයේ දී හාස්‍යය, උපහාසය මෙන් ම අනුකම්පාව ද පෙරදැරි කොට, චරිත තුළ ඇති සැබෑ ගති ලක්ෂණ පාඨකයාට වටහා දීමට සමත් වෙති.

සද්ධර්මරත්නාවලියෙහි අන්තර්ගත වන කතා වස්තු තුළ දැකිය හැකි ලක්ෂණ කීපයකි. සෑම කතා වස්තුවක් ම ඉදිරිපත් කිරීමට ප්‍රථම එම කතා වස්තුව දැක්වීමට හේතුව කතාව ආරම්භයේ දැක්වීමත්, කතාව අවසානයේ දහම් පණිවිඩයක් ලබා දීමත්, ඇතැම් කතා තුළ අතීත කතාව ද ඉදිරිපත් කිරීමත් ඒ අතරින් කිහිපයකි.

සද්ධර්මරත්නාවලියෙහි එන 256 වන කතා වස්තුව වන උග්ගසේන නම් සිටු පුත්හුගේ වස්තුව මෙහි දැක්වේ. කතාව අවසානයේ ඒ ඇසුරෙන් ලබා දෙන පණිවිඩය වන්නේ "මේ සිත තබා අනුන්ට හෙළා පිරිහෙළා කීමෙන් දුරු විය යුතු යන්නයි." එහි අතීත කතාව වන්නේ බරණැස් නුවර වැසියන් කාශ්‍යප බුදුරදුන්ට රන් දාගැබක් ඉදි කරන අවස්ථාවේ වූ සිද්ධියකි.

තව ද උගනිතත් නිරවද්‍ය ශිල්පයක් මුත් සාවද්‍ය ශිල්පයෙන් ඓහලෞකික ප්‍රයෝජනයක් මුත් පාරලෞකික ප්‍රයෝජන නැති නියාව භාගවත්ට උග්ගසේන නම් සිටුපුත්හුගේ වත කියමු.

කෙ සේ ද යත්-

නටක විද්දතු පන් සියයෙක් හවුරුද්දෙන් ස මසින් රජගහා නුවරට අවුදින් රජ්ජුරුවන්ට සතියක් මුළුල්ලෙහි කෙළි පෑ බොහෝ රත් රන් ලැබෙති. අතරතුරේ ලබන සඞ්ග්‍රහයේ පමණ නැත. බොහෝ දෙනත් මැසි මත්තෙහි මැසි ගස්වා ගෙන කෙළි බලති.

එක් දවසක් කඹයේ නටන එකකුගේ දුවක් හුණදඬු අගක දී නටන එකක් ශිල්ප බලයෙන් උඩ අහස සක්මනුත් කෙරෙයි; නටයි; ගීත් කියයි. එ දවස් උග්ගසේන නම් සිටුපුත් යාළණු කෙනකුන් හා සමග මැස්සක් මත්තෙහි සිට ආස සිට නටන ඒ විද්දත් දුවගේ හාවභාව ලීලා දැක වායොධාත්වාධික රූප කලාප විකාරයක් බලවත් නියා ය යි නො සිතා ඇ කෙරෙහි බලවත් වූ ප්‍රෙම ඇති ව 'ලදොත් ජීවත් වෙමි. නොලදොත් මියෙමී' සිතා ගෙන නො කා නො බී හැඳට නැඟී ලා වැද හොත්තාහ. දෙ මවුපියන් විචාළ කල්හි විද්දත් දුව කෙරෙහි ආලයෙන් නියාව කිවු ය. දෙ මවුපියෝ ඒ අසා "පුත, තෙල ලෙස කිරීම තොපටත් අපටත් තරම් නො වෙයි. තරම් තැනකින් සරණක් ගෙනවුත් පාවා දෙම්හ" ම් කිවු ය. ඌ නො ගිවිසිමත් ම ය. නො ගිවිස්නා උන්ගේ යාළුවාණන් ද කැඳවා ලා මසුදාසක් දී ලා "තෙල අහස සිට නැටූ විද්දත් දුවගේ පියාට දී ලා තමාගේ දුව ම පුතුන්ට පාවා දෙන්ට කියව" යි කියා ලා යවූහ.

විද්දතාණෝ ද ඒ අසා "ම දුව විකුණන්නා නැත. රන් හැර ගෙන නො දෙමි. අපටත් රක්ෂාව නම් ඌ ම වෙ ද? නො ලදොත් මියෙත් නම් මිය ප්‍රයෝජන කිම් ද? අප හා එක් වන්නා ම දුව පාවා දෙමි" යි කිවු ය. දෙමවුපියෝ එ පවත අසා බිඳුවන්ට සිතා දෝ කීහ. "එසේ වී නම් මම උන් හා එක් වෙමි." කියා ලා නෑයන් සියන් නො එක් ලෙසින් නැවතුවත් සිතා ගත් සිතිවිල්ල පිරිමැසූ බව මුත් කාරිය නො සලකා විද්දතුන් ළඟට ගියහ. විද්දතාණෝ ද, සිටු පුත්‍රයාණන් දන්නා විද්දත් ශිල්පයක් නැතත් ඒ දෙය මේ දෙය අල්වා ගන්ට වුවත් සහායක් වුවමනා හෙයින් දුවණියන් පාවා දී ලා උනුත් කැඳවා ගෙන රට මුළුල්ලේ කෙළි ළළු පෑ ඇවිදිති.

ඒ විද්දත් දූත් නො බෝ කලෙකින් සිටුපුත් හට පුතකු වදා-පියා නළවන කල "ගැල් රකිනවුගේ පුත" "බර උසුලන්නවුගේ පුත," "කුමකුත් නො දත්තවුගේ පුතැ" යි කිය කියා නළවයි. සිටුපුත්හු ද, ගැල් රඳවා ලා හුන් තැන දී ගොන්ට තණ ගෙනවුත් ලති. කෙළි ලළු පෑ ඇවිදි තැන ලත් දෙයක් යන එන තැනට අදිති. එ ම නිසා විද්දත් දූත් පුතු නළවන යම් විටෙක එ ම කියයි. සිටු පුත්‍රයාණෝත් ගීයක් යමක් අනිකකු නො ව තමන් අරබයා කියන නියාව දැන ලා "මේ හැම මා අරභයා කියවු දැ?" යි විචාළෝ ය. "එසේ ය, අනික් කාට කියම් ද? තොප ම කොට ඇවිදිනා කටයුතු හෙයින් තොප ම අරභයා කියමි" යි කී ය. "තොප නිසා විද්දත් වූවා මඳින් නපුරැත් ඇසුව මනා ද? පලා යෙමි" බිනීම් හරවා ගත හැක්කැ යි සිතා කී ය. ඔයිත් "තොප ගිය මැන, හුන මැනව. තොප කුමකුත් නොදන්නා තැනැත්තවුන්ගෙන් මට කම් කිම් දැ?" යි කියා ලා අවකප්පනයෙන් සැදූ හසු රන අල්වා ඇදි ඇදි සේ දුවන්නා සේ එ ම කිය කියා පුතු නළවයි.

ඕ තොමෝ තමාගේ රූ සම්පත් හැර ගෙන, සිටුපුත්‍රයාණන් තමාගේ කොල්ලකු කොටත් නො සිතයි. සිටු පුත්‍රයාණෝ ද 'මැගේ මේ අභිමානය මැට වඩා සම්පත් ඇත්තන් ඇති හෙයින් සම්පතක් නිසාත් නො වෙයි. තමා ජාති සම්පන්න නො වන හෙයින් ජාතියක් නිසාත් නො වෙයි. රූපත් හෙයින් ඒ හා තමා දන්නා ශිල්ප පමණක් නිසා ය. මෑ දන්නා ශිල්පත් උගත් හෙයින් මුත් සයංසිද්ධ නො වන්නේ වේ ද? ඇගේ ඒ බෑවුම් පලවා මමත් ශිල්ප උගනිමී' මයිලණුවන් කරා ගොසින් තමන් සමර්ථ හෙයින් උන් දන්නා ශිල්ප ඉගෙන ගෙන පයි ඇදීමෙන් හැරී ගොසින් රට මුළුල්ලේ ශිල්ප පෑ ගෙන ඇවිදිනෝ, රජගහා නුවර උපන් වැඩී නුවර නො වේ දැ යි ලජ්ජාවෙන් වළහාත් නොපියා ඊටත් අවුත් "මෙ තනට සත් වන දවස් මම ශිල්ප දක්වමී" උග්ගසේන සිටුපුත් නුවරට කියා යවූහ.

සත් වන දවස් බොහෝ දෙනත් රැස් ව මැසි මත්තේ මැසි ලා ගත්හ. උග්ගසේන සිටුපුත්හු ද සැට රියන් හුණදණ්ඩක් බිම හිඳුවා ලා හුණදඬු අගට නැංගෝ ය. එදවස් බුදුහුත් අලුයම් වේලේ ලොව බලන සේක් හුණදඬු අගට නැගෙන්නාට පෙරාතු ව තමන් වහන්සේගේ නුවණ නමැති හුණදඬු අග හුන්නවුන් දැක, වන්නේ කුමක් දෝ හෝ යි බලන සේක් 'සිටුපුත් තෙමේ ශිල්ප දක්වමී කියා ලා හුණදඬු අග සිට්ටි. ඔහුගේ නැටීම් දක්නා නිසා බොහෝ දෙන රැස් වෙති. මම එතැන දී ගාථාවක් කියමී. ඒ අසා සුවාසූ දහසක් දෙන නිවන් දකිති. උග්ගසේනයෝත් හුණදඬු අග දී ම රහත් වෙතී' දැන වදාළ සේක. එසේ දැන, දෙ වන දවස් සිඟා වඩනා වේලා සලකා ලා මහණ ගණ පිරිවරා රජගහා නුවරට සිඟා වන් සේක.

උග්ගසේන නම් සිටුපුත් ද බුදුන් ඇතුළු නුවරට නො වඩනා තෙක් ම කෙළි ලළු බලන්ට රැස් වූවන් කොක්සන් ගසන නියාවෙන් ඇඟිලි පෑ හිඟි කොට ලා හුණදඬු අග සිට ලා නික්ම සිස් අහස ම සත් විටක් පෙත්තක් මෙන් සිසැරී ලා බැස හුණ දඬු අග සිටියහ. ඒ වේලාට බුදුහුත් නුවර ඇතුළට වඩනා සේක් රැස් වූ පිරිස බව අග වුවත් සිටිනට සමර්ථ වූ තමන් වහන්සේ දිසාව බලත් මුත් හුණදඬු සැට රියනක් විතර මුත් වඩා උඩ සිටිනට බල නැති උග්ගසේනයන් දිසාව නො බලන ලෙසට ඉටා වදාළ සේක.

උග්ගසේනයෝත් තමන් පානා කෙළි තමන් ම දක්නා පමණ මුත් රැස් වූවවුන් නො බලන නියාව දැන මුසුප්පු ව ගොසින් 'හවුරුද්දකින් සමසෙකින් අරුමයක් සේ පානා කෙළි බුදුන් අවුත් මෙ තැනට සම්භව ඔබ ම අමුතු ව පහළ වූවා සේ බලන බව මුත් මෙ නුවරට මා ආදියෙන් පානා කෙළි බලන්නෝ නැත. පැසුණු ගොයම් මුල් වූවා සේ දුක් ගෙන උගත් ශිල්පය සිස් වී ය' යි සිතූහ. බුදුහුත් උන්ගේ අදහස් දැන මුගලන් මහ තෙරුන් වහන්සේ බණවා ලා "උග්ගසේන නම් සිටුපුත්‍රයාට ශිල්ප දක්වන්ට කියව" යි වදාළ සේක. මහ තෙරුන් වහන්සේත් ගොසින් -

ඉඞ්ඝ පස්ස නටපුත්ත - උග්ගසෙන මහබ්බල,
කරොහී රඞ්ගං පරිසාය - හාසයයස්සු මහාජනං,

යන ගාථාව වදාරා බුදුන් වදාළ මෙහෙවර වදාළ සේක. කෙළි ලෙළුවෙහි යොදන්ට බුදුන් මහ තෙරුන් වහන්සේට විධාන කෙළේ හැයි ද යත හොත්: මත්තෙහි ඕ හට වන ප්‍රයෝජනය සලකා ය. උග්ගසේනයෝ ද මහ තෙරුන් වහන්සේගේ කථාව අසා 'බුදුහුත් මාගේ ශිල්ප දක්නා කැමැති නියා වනැ' යි සතුටු ව හුණදඬු අග සිට ම -

'ඉඞ්ඝ පස්ස මහාපඤ්ඤ - මොග්ගල්ලාන මහිද්ධික,
කරොමි රඞ්ගං පරිසාය - හාසයාමි මහාජනං'

කියාලා හුණදඬු අගින් අහසට නැඟී ලා තුදුස් විටක් විචර අහස සිසැරී-පියා බැස ලා හුණදඬු අග සිටියහ.

බුදුහුත් බණ වදාරන සේක් "උග්ගසේනයෙනි, කෙළි ලෙළුවෙහි ඇලුම් තබා ලා ගිය දවස පැවැති පස් කඳෙහි ආලයත් හරුව. එ ම පස් කඳ එන දවස පවත්නා ඇලුමුත් හරුව. දන් පවත්නා ස්කන්ධයන් කෙරෙහි ආලයත් හරුව. එ සේ කළා නම් කෙළි ලෙළුවෙන් තබා ජාති ජරා මරණිනුත් මිදෙව" යි වදාළ සේක. දේශනා කෙළවර සුවාසූ දහසක් විතර සත්ත්වයෝ නිවන් දුටහ.

උග්ගසේන සිටුපුත්‍රයාණෝ ද කර' ග රහත් වන්නා සෙ නො වන බව මුත් හුණදඬු අග දී පිළිසිඹියා පත් රහත් ව හුණදණ්ඩෙන් බැස-පියා බුදුන් ළඟට ගොසින් පසඟ පිහිටුවා වැඳ ගෙන මහණ කරන්ට ආරාධනා කළහ. බුදුහුත් දකුණත දික් කොට ලා "මහණ, මෙ සේ එව" යි වදාළ සේක. ඒ වේලෙහි තුන් සිවුරු ආදි වූ අට පිරිකර ධරා, සැට වස් ගිය මහ තෙර කෙනකුන් වහන්සේ මෙන් ආකල්ප සම්පන්න වූ සේක. වහන්දෑ ද "ඇවැත්නි, සැට රියන් හුණදණ්ඩෙන් බස්නා ගමනේ භයෙක් නො වී ද?" යි විචාරා "අපට භයෙක් නැතැ යි කී කල්හි බුදුන් කරා ගොසින්, "සවාමීනි, උග්ගසේන තෙරහු හුණදණ්ඩෙන් බස්නා ගමනේ තමන්ට භයක් නැතැ යි කියති. එ ලෙස කියා තමන් රහත් නියාවක් හඟවතී" කී සේක. බුදුහුත් "මහණෙනි, ම පුතුන් වැන්නවුන්ට භයෙක් කොයින් ද?" යි වදාරා බ්‍රාහ්මණ වගින් ගාථාවක් වදාළ සේක. දේශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් නිෂ්ප්‍රයෝජන වූ කෙළි ලෙළු ආදියෙහි ඇලුම් හැර, නිවනෙහි ම ඇල්ම කොට, තුන් දුසිරින් දුරු ව තුන් සුසිරි පුරා මතු මතුයෙහි ලැබිය යුතු ලොවී ලොවුතුරා ගුණ විශේෂයට පිහිට විය යුතු.

නැවත එක් දවසක් ධම් සෙබෙයි කථාවක් උපදවන සේක් "ඇවැත්නි, රහත් වන්ට නිසි මෙ වැනි පිනක් ඇති කෙනකුන් විද්දතුන් හා එක් වන්ටත් කාරණ කිම් ද? රහත් වන්ට නිසි ව කළ පිනුත් කවරේ ද?" යි කී සේක. බුදුහුත් ඒ අසා වදාරා "මහණෙනි, මේ දෙකට ම නිස්ස කොළෝ මූ තුමූ ම ය" යි වදාරා, එ ම විහුත කරන්නට "ගිය දවස කසුප් බුදුන්ගේ රන් දා ගබ කරන කල්හි බරණැස් නුවර ඇත්තෝ සාල් බත් ගෙන්වා ගෙන දා ගබ මෙහෙවර කරම්හයි යන්නාහු අතුරු මඟ දී එක් තෙර කෙනකුන් සිඟා ගියවුන් එක් කුල දුවණි කෙනෙක් දැක සමණන්ට "එක් තෙර කෙනකුන් වහන්සේ සිඟා වැඩි සේක. ගෙන යන ගැල්වල බතුත් බොහො ව ඇත. බත් පාත්‍රයක් පිළිගන්වා ගන්ට පාත්‍රය ගෙනව මැනවැ' යි කිවු ය. උයිත් නො මැළි ව පාත්‍රය ගෙනවු ය. බත් පාත්‍රය පුරා ලා ස්ථවිර භික්ෂූන්ට පිළිගන්වා ලා 'නිවන් දකුමෝව!' යි පතා ගත්හ. උන්ගේ දන පිළිගන්ට සම්බ වූවෝත් රහත් කෙනෙක. එ හෙයින් දිවසින් බලනුවෝ ප්‍රාර්ථනාව තෙල ලෙසින් ම සමෘද්ධ වන නියාව දන සිනා පහළ කළහ. දන් දුන් උපාසිකාවෝ ද සිනා පහළ කළා දැක කාරණත් විචාරා නො පියා සමණන්ට "මුන් වහන්සේ සිනාවක් සී-පී සේක. විද්දත් කමෙක්

ඇති වනැ" යි කිවු ය. සමණෝ ද "එ සේ නො කියව" යි නො කියා "එ සේ සැටි ය" යි කියා, උන් කීවා ම ගිවිස ගෙන නික්මුණාවු ය. මේ උන් දෙන්නා කළ කී කට යුතු ය. උ⁹ ඊ ආයු පමණින් සිට දෙව් ලොව ඉපැද දූන් ඉන් චුත ව එ, ලෙස බස කියා ලූ ස්ත්‍රී විද්දත් දූ ව උපන. උග්ගසේනයෝ සිටු කුලයෙහි ඉපැදත් විද්දත් සැටි යැ යි කියා ලූ බස ගිවිසි පමණෙකින් තුමූ නො විද්දත් වත් විද්දතුන් හා එක් වූ ය. රහත් තෙරුන්ට දී ලූ බත් පාත්‍රයෙහි අනුසසින් උග්ගසේන තෙරහු රහත් වූ හ. විද්දත් දූ ද මෙහෙණි සස්නෙහි මහණ ව රහත් වීමෙන් මනුෂ්‍ය ජාතීන් අඩු ව උපනත් ආර්ය ජාතීන් සරි වුව" යි වදාළ සේක.

මේ සිත තබා, අනුන්ට හෙළා පිරිහෙළා කීමෙන් දුරු විය යුතු.

අරුත් පැහැදිලි කිරීම

නටක විද්දතු	-	නැටීමේ දක්ෂ
යාළණු	-	යහළු
විකාරයක්	-	කැළඹීමක්
නොගිවිසිමත් ම ය	-	එකඟ නොවුණේ ම ය
අවකප්පනය	-	වැරදි ලෙස පිළියෙල කළ
පයි ඇදීමෙන්	-	පසුම්බි ඇදීමෙන්
කොක්සන්	-	මහ හඬින් සිනා සීම
මුසුප්පුව	-	කනගාටුව
පිළිසිඹියා	-	ප්‍රතිසංහිධාන (විශ්ලේෂණය කොට දනගැනීමේ නුවණ)
සමණන්ට	-	සැමියාට
සි-පී සේක	-	සිනා සුණු සේක
වායොධාත්වාධික	-	වාතය අධික කොට ඇති

අභ්‍යාස

01. ධර්මසේන හිමියන්ගේ කතා කීමේ කලාවෙහි විශේෂත්වය උග්ගසේන සිටු පුත්හුගේ වස්තුව ඇසුරෙන් පැහැදිලි කරන්න.

02. ධර්මසේන හිමියෝ හාස්‍යය, උපහාසය මෙන් ම අනුකම්පාව ද පෙරදැරි කොට ගෙන චරිත නිරූපණය කරන ආකාරය නියමිත කතා වස්තුව ඇසුරෙන් විමසන්න.

03. "උග්ගසේන සිටු පුත්‍රයා ජීවිතයේ අභියෝග ජය ගත් අයෙකි." සිටුපුත්‍රයාගේ චරිතය ඇසුරෙන් සාකච්ඡා කරන්න.